# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019

# 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

# ලකුණු බෙදීයාම

## 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I

**පළමු පත්‍රයට බහුවර්ණ ප්‍රශ්න 50 ක් අඩංගු වෙයි.**

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 02$
- ප්‍රශ්න 50 ලකුණු $2 \times 50 = 100$

## 49 - ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II

### I - කොටස

පළමු කොටස ප්‍රශ්න 03 කින් සමන්විත වෙයි. ඉන් ප්‍රශ්න 02 ට පිළිතුර සැපයීම අපේක්ෂා කෙරෙයි.

පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 02

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 20$
- ප්‍රශ්න 02 ලකුණු $2 \times 20 = 40$

### II - කොටස

දෙවන කොටස ප්‍රශ්න 05 කින් සමන්විත වෙයි. ඉන් ප්‍රශ්න 03 ට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරෙයි.

පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 03

- එක් ප්‍රශ්නයකට ලකුණු $= 20$
- ප්‍රශ්න 03 ලකුණු $3 \times 20 = 60$

I සහ II කොටස් සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 5 x 20 = 100

අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I | - $50 \times 02$ | $= 100$ |
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II | - $05 \times 20$ | $= 100$ |
| | | 200 |

අවසාන ලකුණු සංඛ්‍යාව 200/2 $= 100$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ 4/5
.....................................................
.....................................................

(ii) ..................................................... √ △ 3/5
.....................................................
.....................................................

(iii) ..................................................... √ △ 3/5
.....................................................
.....................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

# ලකුණු දීමේ පටිපාටිය පිළිබඳ විස්තරය

I පත්‍රය - ප්‍රශ්න පත්‍රය

I පත්‍රය පිළිතුරු

2 පත්‍රය - ප්‍රශ්න පත්‍රය

2 පත්‍රය - පිළිතුරු

## I - කොටස

**ප්‍රශ්න අංක 01**

**මෙම ප්‍රශ්නය අනුකොටස් 5 කින් සමන්විත වේ.**

එක් ප්‍රශ්නයකට ලකුණු 04

කොටස් 5 ට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 02**

මෙම ප්‍රශ්නය අනු කොටස් 5 න් සමන්විත වේ.

එක් ප්‍රශ්නයකට ලකුණු 04

කොටස් 5කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 03**

මෙම **ප්‍රශ්නය අනු කොටස් 5 කින් සමන්විත වේ**

**එක් ප්‍රශ්නයකට ලකුණු 04**

කොටස් 5කට ලකුණු 5 x4 20

## II - කොටස

**ප්‍රශ්න අංක 04**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 05**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 06**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 07**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

**ප්‍රශ්න අංක 08**

මෙම ප්‍රශ්නය අනු කොටස් 4 කින් සමන්විත වේ

එක් කොටසකට ලකුණු 05

කොටස් 4කට ලකුණු 5 x4 20

## ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - I

මෙම ප්‍රශ්න පත්‍රයට බහුවරණ ප්‍රශ්න 50 ක් ඇතුළත් වන අතර ප්‍රශ්න 50 ටම පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.ප්‍රශ්න සැකසීමේ දී මුළු විෂය මාලාවම ආවරණය වන සේ ඒවා සකසා ඇත. එමගින් විෂය පිළිබඳව ශිෂ්‍යයා තුළ පූර්ණ දැනුමක් තිබේදැයි පරීක්ෂා කිරීමට හැකියාව ලැබෙනු ඇත.

## ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - II

**01 ප්‍රශ්නය**

මෙම පළමු ප්‍රශ්නයෙන් ශුභාරංචි හතර පිළිබඳ සිසුන්ගේ දැනුම පරීක්ෂාවට ලක්කෙරේ. ක්‍රිස්තුත් වහන්සේගේ ඉගැන්වීම් උන්වහන්සේ වදාළ උපමා කථා, සිදුකළ ප්‍රාතිහාර්ය හා උන්වහන්සේගේ මරණය සහ ඉගැන්වීම් ගැන මෙන්ම ක්‍රිස්තුත් වහන්සේ මෙලොව සිටි සමයේ පලස්තීනයේ විසූ විවිධ ජන කණ්ඩායම් සහ ඔවුන්ගේ ක්‍රියා කලාපය පිළිබඳව කරුණුත් මෙම ප්‍රශ්ණයෙහි අඩංගු වේ.

**02 ප්‍රශ්නය**

ශුද්ධාත්තමයන් ආගමනයක් සමගම සභාව ක්‍රමයෙන් වැඩි වර්ධනය වීම ඇරඹුණි. ජෙරුසලමින් ආරම්භ වූ සභාව වැඩිකල් නොගොස් අවට බොහෝ ප්‍රදේශවල හා රටවල් කරා ව්‍යාප්ත වන්නට විය. කෙසේවුවද එසේ සභාව පැතිරයාමේ දී එයට බොහෝ බාධක හා අභියෝගවලට මුහුණ පෑමට සිදුවිය. සභා ඉතිහාසය සම්බන්ධයෙන් වු මෙම දෙවන ප්‍රශ්නයට සභාව දස දෙස පැතිර යාමේ දී මුහුණ පෑමට සිදු වූ කරදර බාධක හා අභියෝගත්,සභාව ඇතුළතින්ම බිහි වූ සභා භේද හා වේ භේදත් ඒවාට පිළිතුරු දීමට බිහි වූ සභා චින්තකයන් සහ එතුමන්ලාගේ ඉගැන්වීම ආදියත්, සභා ධර්මවේදය ගොඩනැගීමට පිටිවහලක් වූ කිතුනු විද්‍යා පීඨ ආදිය ගැනත් ඇතුළත් වෙයි.

**03 ප්‍රශ්නය**

13 ශත වර්ෂය අවසාන කාලයේ ඇරඹි දේශ ගවේෂණයත් සමග ක්‍රිස්තියානි ධර්මය ආසියාව තුළ පුළුල් ලෙස ව්‍යාප්ත වීම ඇරඹිය ද අපෝස්තලික යුගයේ හා පළමු ශතවර්ෂයේ සිටම ආසියාවේ සමහර රටවල ක්‍රිස්තියානි ධර්මය පැවති බවට බොහෝ ඓතිහාසික සාක්ෂි දැන් දැන් ලැබෙමින් පවතියි. විශේෂයෙන්ම තෝමස් අපොස්තුලුතමන් විසින්ම ඉන්දියාවට ක්‍රිස්තියානි ධර්මය ගෙන ආ බව බොහෝ දෙනකුගේ මතයයි. ආසියාවේ ක්‍රිස්තියානි ධර්මය ගැන වූ මෙම ප්‍රශ්නයෙන් ශ්‍රී ලංකාව, ඉන්දියාව, ජපානය යන රටවල ක්‍රිස්තියානි ධර්මය සිදු වූ යම් යම් සේවාවක් ගැන විමර්ශනයට ලක් කෙරෙයි.

**04 ප්‍රශ්නය**

ශුද්ධ වූ පාවුළුතුමන්ගේ ඉගැන්වීම් සභාවේ දේව ධර්මයේ වර්ධනය සඳහා මහත් රුකුලක් විය. එතුමන්ගේ මූලික ඉගැන්වීම් අතර දේව වරප්‍රසාදය ද එක් මූලික තේමාවකි. මෙම හතරවන ප්‍රශ්නයේ පළමු කොටසින් පාවුළුතුමන්ගේ ලිපිවල එන දේව වරප්‍රසාදය පිළිබඳව සිසුන්ගේ දැනුම විමසන අතර

දෙවන කොටසින් දේව වරප්‍රසාදයෙන් පිරි ජනතාව වන ක්‍රිස්තියානීහු දෙවියන් වහන්සේගේ මැවිල්ල හා පරිසරය ආරක්ෂා කිරීමට කැපවිය යුතු ආකාරය ගැන විමර්ශනය කෙරේ.

**05 ප්‍රශ්නය**

රෝම අධිරාජ්‍යයේ අගනුවර කොන්ස්තන්තිනෝපලය කරා ගෙනයාමත් සමගම ආරම්භ වූ පෙරදිග හා අපරදිග සභාවල ගැටුම් ක්‍රමයෙන් වැඩි වර්ධනය වී අවසානයේ සභාව කොටස් දෙකකට වෙන් විය. මෙම පස්වන ප්‍රශ්නයේ පළමු කොටසින් සභාව පෙරදිග සහ අපරදිග වශයෙන් බෙදී යාමට තුඩුදුන් දේව ධාර්මීය සහ නායකත්වය පිළිබඳ හේතු විමර්ශනය කෙරේ.

එම ප්‍රශ්නයේ දෙවන කොටසින් දේව රාජ්‍යයේ සලකුණක් වීම සඳහා ශුද්ධ වූ සභාව තුළ එකමුතුකමේ ඇති අවශ්‍යතාවය ගැන සිසුන්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

**06 ප්‍රශ්නය**

06 වන ප්‍රශ්නයේ මූලික තේමාව වන්නේ අධ්‍යාපනයයි. නමවන ශතවර්ෂයේ ජීවත් වූ මහා චාල්ස් අධිරාජයා විසින් සෑම ආසන දෙව් මන්දිරයක් අසලම අධ්‍යාපන ආයතනයක් පිහිටු විය යුතු බවට බල කෙරේ. මෙසේ ආරම්භ වූ අධ්‍යාපන ආයතන මගින් යුරෝපීය සමාජය ගොඩනැගීම සඳහා වූ සේවාව මෙම ප්‍රශ්නයෙන් විමර්ශනය කෙරේ.

මනුෂයකුට තමාගේ පෞද්ගලික දියුණුවත් චරිත වර්ධනයටත් අධ්‍යාපනය අත්‍යවශ්‍ය වෙයි. සෑම අංශයකින්ම පරිපූර්ණ සමාජයක් බිහිවීම සඳහා අධ්‍යාපනයේ ඇති අවශ්‍යතාව ගැනවූ සිසුන් තුළ ඇති දැනුම මෙම 06 වන ප්‍රශ්නයේ දෙවන කොටසින් පරීක්ෂා කෙරේ.

**07 ප්‍රශ්නය**

ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපීය ජාතීන් තුනෙන්ම යම් ආකාරයකින් ශ්‍රී ලංකා සමාජයට සේවාවක් සිදු වුණි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයන් පැමිණෙන විට සමාජය බොහෝ සේ වෙනස් වී තිබූ හෙයින් ඔවුන්ගේ සේවාව සුවිශේෂී එකකි. අධ්‍යාපන හා සමාජ සේවාවෙහි යෙදෙමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියා කිරීමට බොහෝ දෙනෙකුට අවස්ථාව එළඹුණි. බ්‍රිතාන්‍ය සමයේ අධ්‍යාපන සහ සමාජ සේවාව පිළිබඳව මෙම හත්වන ප්‍රශ්නයෙන් විමර්ශනය කෙරෙයි.

07 වන ප්‍රශ්නයේ දෙවන කොටසින් ක්‍රිස්තියානි ධර්මයේ උන්නතිය සඳහා කලා මාධ්‍යයන් මෙන්ම නූතන සමාජ මාධ්‍යයන් යොදා ගත හැකි ආකාරය විමසා බැලේ.

**08 ප්‍රශ්නය**

ශුද්ධ වූ සභාව විවාහය හා පවුල් ජීවිතය ඉතා උතුම් කොට සලකයි. ඒ නිසාම දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව ප්‍රකාශනයේ එක් මූලික තේමාවක් වන්නේ ද විවාහය හා පවුල් ජීවිතයයි. 08 වන ප්‍රශ්නයෙන් විවාහය හා පවුල් ජීවිතය ගැන දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් පිළිබඳව සිසුනගේ දැනුම පරීක්ෂා කෙරේ.

ප්‍රශ්නයේ දෙවන කොටසින් දිනෙන් දින ව්‍යාකූලත්වයට පත්වන විවාහය හා පවුල් ජීවිතය හමුවේ ඒවා රැකගැනීම පිණිස පවුලක දරුවන් වශයෙන් කළ හැකි කළ දේ ගැන සිසුන්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

AL/2019/49/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

| | |
|---|---|
| ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | I |
| கிறிஸ்தவ நாகரிகம் | I |
| Christian Civilization | I |

49 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොද දක්වන්න.**

**1.** ආදි මිනිසුන් කණ්ඩායම් වශයෙන් ජීවත්වීම ආරම්භ කළේ කවර කාලයකට පෙර ද?
(1) க்ரி.பு. 3000 (2) க்ரி.பு. 5000 (3) க்ரி.பு. 8000 (4) க்ரி.பு. 30 000 (5) க்ரி.பு. 40 000

**2.** ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ ස්ථාන තුනක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) යුදයාව, සුමේරියාව, ගලීලය (2) සුමේරියාව, ජෙරුසලම, කානා
(3) සමරියාව, මෙසපොතේමියාව, යුදයාව (4) ගලීලය, නාසරෙත්, ජෙරුසලම
(5) නාසරෙත්, බැබිලෝනියාව, කානා

**3.** මිසරයේ ඊශ්‍රායෙල්වරුන් වහල් මෙහෙයේ යෙදී සිටි සමයේ පාලනය කළ රජතුමා කවු ද?
(1) නෙබුකද්නසාර් (2) දෙවන රම්සේස් (3) සාර්ගොන් (4) සයිරස් (5) එපිපානෙස්

**4.** ජනවන්දනාව සඳහා වල්ගේට් ලතින් බයිබලය භාවිත කිරීමට තීරණය කරන ලද ජගත් මන්ත්‍රණ සභාව වන්නේ,
(1) නිසියා ය. (2) කැල්සිඩොන් ය. (3) එපේසස් ය.
(4) ත්‍රිදෙන්තියානු ය. (5) පළමු වතිකානු ය.

**5.** පලස්තීන මුහුදු තීරයේ දකුණු භාගයේ දිවි ගෙවූ ජනතාව වන්නේ,
(1) පිලිස්තිවරුන් ය. (2) ෆිනිසියානුවරුන් ය.
(3) මැකබිවරුන් ය. (4) ඒදොම් වැසියන් ය.
(5) මොවබ්වරුන් ය.

**6.** පලස්තීනයේ බටහිර කඳුවල පිහිටා **නොමැත්තේ**,
(1) ඉහළ ගලීලය ය. (2) ජෙරුසලෙම ය.
(3) සමරියාව ය. (4) හේබ්‍රොන් ය.
(5) කාර්මෙල් කන්ද ය.

**7.** පහත ප්‍රකාශ සලකා බලන්න.
A - බැසිලිකා දෙව් මැදුර සෘජුකෝණස්‍රාකාරව ගොඩනගා ඇත.
B - අහස් නැගීමේ දෙව් මැදුර පිහිටා ඇත්තේ කොන්ස්තන්තිනෝපලයෙහි ය.
C - ක්‍රිස්තුන් වහන්සේ උත්පත්තියේ දෙව් මැදුර පිහිටා ඇත්තේ බෙත්ලෙහෙමෙහි ය.
D - ශුද්ධාත්මයාණන් වහන්සේගේ දේවස්ථානය පිහිටියේ ඔලිව් කන්දේ ය.
E - ක්‍රිස්තුන් වහන්සේගේ සිරුර තැන්පත් කර ඇති දෙව් මැදුර පිහිටියේ කල්වාරි කන්දේ ය.
මේවායින් නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, C සහ E (3) B, C සහ D (4) B, C සහ E (5) C, D සහ E

**8.** ඊශ්‍රායෙලයේ විනිශ්චයකාරවරුන්ට පවරන ලද ප්‍රධාන කාර්යක් **නොවන්නේ,**
(1) සමාජය තුළ නීති තහවුරු කිරීම ය.
(2) ගැටුම් නිරාකරණය කිරීම ය.
(3) අන්‍ය ජාතික ආක්‍රමණයන්ගෙන් මුදා ගැනීම ය.
(4) ගිවිසුමට පක්ෂපාතිවීමට දිරිමත් කිරීම ය.
(5) ජෙරුසලමේ දේව මාලිගයට ගොස් පාස්කුව පැවැත්වීමට දිරිමත් කිරීම ය.

**9.** සැම්සන්ගේ ප්‍රධාන දායකත්වය වූයේ ඊශ්‍රායෙල් ජනතාව කවර ජාතීන්ගෙන් මුදවා ගැනීම ද?
(1) ඊජිප්තුවරුන්ගෙන් (2) ඒදොම්වරුන්ගෙන්
(3) පිලිස්තිවරුන්ගෙන් (4) ෆිනිසියානුවරුන්ගෙන්
(5) අසිරියානුවන්ගෙන්

**10.** ඊශ්‍රායෙලයේ රජවරුන් සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - රතු මුහුද අසල වරායක් ගොඩනැගීම
B - ප්‍රඥාවන්තව ක්‍රියා කිරීමට දේව අනුග්‍රහය ඇයැද සිටීම
C - මරණය දක්වා ම යාහ්වේ දෙවියන් වහන්සේට විශ්වාස පක්ෂව සිටීම
D - ජෙරුසලම්හි දේව මන්දියරක් ගොඩ නැගීම
E - අසල්වැසි රටවල් සමග නිතර යුද්ධ කිරීම
මේවායින් සලමන් රජතුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D (4) B, C සහ D (5) B, C සහ E

**11.** එස්රා සහ නොහෙමියා ක්‍රියාත්මක කාලය වන්නේ,
(1) දාවිත් රජු සමයේ දී ය. (2) සලමන් රජ සමයේ දී ය.
(3) විප්‍රවාස සමයේ දී ය. (4) පර්සියානු පාලන සමයේ දී ය.
(5) ග්‍රීක පාලන සමයේ දී ය.

**12.** මහා ඇලෙක්සැන්ඩර් රජතුමාගේ ඇවෑමෙන් පසුව පලස්තීන දේශය පාලනය කරන ලද රජතුමා කවු ද?
(1) සයිරස් (2) ඇන්ටියෝකුස් එපිපානස්
(3) ටොලමි (4) පොම්පේ
(5) සෙලුසිද්

**13.** මහා හෙරෝද් රජුගෙන් පසුව ජුදයාව පාලනය කරන ලද අර්කලාවුස් එම තනතුරෙන් පහ කරන ලද්දේ,
(1) රෝගී තත්ත්වයෙන් පසු වූ හෙයිනි.
(2) රෝමවරුන්ට විරුද්ධව ග්‍රීකවරුන්ට සහය වූ හෙයිනි.
(3) කෲරතර පාලනයට එරෙහිව ජුදා වැසියන් රෝමයට පැමිණිලි කළ හෙයිනි.
(4) ජෙරුසලමේ අන්‍ය දේව වන්දනාව පැවැත්වීම හා ජනතාවට ද එසේ කිරීමට බලපෑම් කළ හෙයිනි.
(5) ස්නාවක ජුවාම්තුමන්ට එරෙහිව ක්‍රියා කළ හෙයිනි.

**14.** සදිසිවරුන්ගේ ආරම්භය සිදු වූයේ,
(1) දාවිත් රජු සමයේ දී ය. (2) සලමන් රජු සමයේ දී ය.
(3) ජෙරබෝවම් රජු සමයේ දී ය. (4) අපර විප්‍රවාසි සමයේ දී ය.
(5) ග්‍රීක පාලන සමයේ දී ය.

**15.** ජුදා අන්තවාදී කණ්ඩායමක් වන සෙලට්වරුන්ගේ මූලික අරමුණ වූයේ කුමන පාර්ශ්වයට එරෙහිව යුධ කිරීම ද?
(1) රෝමවරුන් (2) පරිසිවරුන්
(3) සමරිතාන්වරු (4) හෙරෝද් රජ පවුල
(5) ලේකම්වරුන්

**16.** ජුදාවරුන් විසින් කූඩාරම් මංගල්‍යය සිදු කළ කාලය කුමක් ද?
(1) මාර්තු - අප්‍රේල් (2) නොවැම්බර් - දෙසැම්බර්
(3) සැප්තැම්බර් - ඔක්තෝම්බර් (4) අප්‍රේල් සහ දෙසැම්බර්
(5) ඔක්තෝබර් සහ දෙසැම්බර්

**17.** 'යොම් කිපුර්' යනු
(1) අස්වනු මංගල්‍යයකි.
(2) පච් සමාවේ චාරිත්‍රයකි.
(3) මෞලි මංගල්‍යයකි.
(4) දේව මාලිගාව කැප කිරීමේ මංගල්‍යයකි.
(5) දරු උපතක් සැමරීමකි.

**18.** ජුවාම්තුමාගේ (ජොහාන්තුමාගේ) ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේගේ මරණයට වගකිව යුතු වන්නේ,
(1) රෝමවරුන් ය.
(2) සෙලට්වරුන් ය.
(3) පරිසිවරුන් ය.
(4) එසෙන්ස්වරුන් ය.
(5) ජුදාවරුන් ය.

**19.** පහත සඳහන් අයගෙන් එකම කණ්ඩායමකට ඇතුළත් කළ **නොහැකි** වන්නේ,
(1) පරිසිවරු ය.
(2) සදුසිවරු ය.
(3) ලේකම්වරු ය.
(4) එසේනිවරු ය.
(5) ආණ්ඩුකාරවරු ය.

**20.** ජෙරුසලම් මන්ත්‍රණ සභාව පැවැත්වීමට තුඩුදුන් ප්‍රධාන කාරණය වූයේ,
(1) ග්‍රීක බසින් ජන වන්දනාව පැවැත්වීම ය.
(2) සබත් දින උපවාසය පිළිබඳව සලකා බැලීම ය.
(3) ජුදා නොවන ක්‍රිස්තියානීන් විසින් ජුදා නීතිය පිළිපැදිය යුතු බවට බල කිරීම ය.
(4) මළවුන්ගේ උත්ථානය පිළිබඳව උද්ගත වූ විවිධ මත පැවතීම ය.
(5) බොරු දිවැසිවරුන් විසූ නිසා ය.

**21.** පීඩන සම්බන්ධව පහත ප්‍රකාශ සලකන්න.
A - සභාව වඩ වඩාත් ශක්තිමත් වෙමින් වර්ධනය වීම
B - බොහෝ ක්‍රිස්තියානිහු මරණ බිය නිසා තම ධර්මය අතහැර දැමීම
C - ක්‍රිස්තියානිහු රෝම අධිරාජ්‍යය පෙරලා දැමීමට රහසේ සංවිධානය වීම
D - ක්‍රිස්තියානීන්ට තම ධර්මය උදෙසා සාක්ෂි දැරීමට අවස්ථාවක් උදා වීම
E - සභාව තුළ වීරවරයන් බිහිවීමට අවස්ථාව උදා වීම
මේවායින් රෝමානු පීඩන නිසා හටගත් ප්‍රතිඵල මොනවා ද?
(1) A, B සහ C (2) A, D සහ E (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**22.** පහත සඳහන් ප්‍රකාශවලින් ඇලෙක්සැන්ඩ්‍රියන් විද්‍යා පීඨය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) බැසිල් නමැති පූජකතුමන් විසින් ආරම්භ කරන ලදී.
(2) ආරම්භ කරන ලද්දේ පස්වන සියවසේ දී ය.
(3) ෆිලෝ නමැති ජුදා පණ්ඩිවරයා මෙහි නායකත්වය දැරුවෙකි.
(4) ශාන්ත අම්බ්‍රෝස්තුමන් මෙම විද්‍යා පීඨයේ ඉගැනුම ලැබූවෙකි.
(5) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය වඩාත් ඉස්මතු කර දැක්වී ය.

**23.** පහත සඳහන් ප්‍රකාශවලින් අන්තියෝකයේ විද්‍යා පීඨය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ඉස්මතු කර දැක්වීම සහ ඒරියන් වාදය පිළිගැනීම
(2) ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍යත්වය ඉස්මතු කර දැක්වීම සහ ප්ලේටෝගේ දාර්ශනික මත අනුගමනය කිරීම
(3) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍යත්වය ඉස්මතුකර දැක්වීම සහ ඇරිස්ටෝටල්ගේ දාර්ශනික මත අනුගමනය කිරීම
(4) ඒරියන් වාදය පිළිගැනීම සහ ශුද්ධ බයිබලය විවරණයේ දී වචනාර්ථයට මුල් තැන දීම
(5) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ඉස්මතු කර දැක්වීම සහ ඇරිස්ටෝටල්ගේ දාර්ශනික මත අනුගමනය කිරීම

**24.** සභා පියවරු සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - ඇලෙක්සැනඩ්‍රියාවේ විද්‍යා පීඨය හා සම්බන්ධ වූවෙකි.
B - ශුද්ධ වූ බයිබල් විවරණ රාශියක් ලියා ඇත.
C - ජීවිතයේ අවසාන කාලයේ දී මැනකියානු වාදය අනුගමනය කරන්නකු විය.
D - ක්‍රිස්තියානි ධර්මය වැළඳගත් නවකයන් ධෛර්යවත් කරන ලදී.
E - ශාන්ත ජෙරාම්තුමාගේ අනුගාමිකයෙකි.
මේවායින් ඔරිගන්තුමා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ E (4) B, C සහ E (5) C, D සහ E

**25.** මරියතුමිය දෙවියන් වහන්සේගේ මව බව ප්‍රකාශ කරන ලද්දේ කවර මන්ත්‍රණ සභාව ද?
(1) නිසියා (2) කොන්ස්තන්තිනෝපල් (3) කැල්සිඩොන්
(4) එපේසස් (5) ප්ලොරන්ස්

**26.** මුල් යුගයේ තාපස ජීවිතය සම්බන්ධ නිවැරදි ප්‍රකාශ සඳහන් යුගලය තෝරන්න.
(1) ප්‍රාණ පරිත්‍යාගිභාවයට විකල්පයක් වශයෙන් තාපස ජීවිතය ඇරඹිණි. : තාපසවරු කණ්ඩායම් වශයෙන් විසූහ.
(2) පුරුෂ සහ කාන්තා යන දෙපක්ෂය ම තපස් ජීවිතයට ඇතුළු වූහ. : ශාන්ත බැසිල්තුමා පළමු තාපසතුමා ලෙස සැළකෙයි.
(3) තාපසවරු තනි තනි ව වෙසෙමින් භාවනාවේ සහ යාච්ඤාවේ නිරත වූහ. : තාපසවරු සිය කැමැත්තෙන් දිළිඳු ජීවිතයක් ගත කරමින් ව්‍රතශුද්ධිය ආරක්ෂා කළහ.
(4) තාපසවරු යාච්ඤා කිරීමට පමණක් එක් තැනකට රැස් වූහ. : ශාන්ත සිරිල්තුමා පළමු තාපසතුමා ලෙස සැලකෙයි.
(5) තපස්වරු සිරියාවේ සහ ඊජිප්තුවේ කාන්තාර හා වනගත ප්‍රදේශවල විසූහ. : පුරුෂ පක්ෂයේ අය පමණක් තපස් දිවියට ඇතුළු වූහ.

**27.** තාපසවරුන් සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - තාපසවරුන් තනි තනිව විසිය යුතුයැයි සැලකූහ.
B - බටහිර තාපසවරයේ පියා ලෙස සැලකෙයි.
C - තාපසවරු ක්‍රිස්තියානි ජීවිතයේ සහ ශුද්ධවන්තභාවයේ ආදර්ශය ලෙස සැලකූහ.
D - තාපසවරුන් වෙනුවෙන් නීති මාලාවක් සාදන ලදී.
E - තාපසවරුන් සංඛ්‍යාව වැඩි වූ විට ඔවුන් කණ්ඩායම් වශයෙන් වෙන් කරන ලදී.
මේවායින් ශාන්ත බැසිල්තුමා සම්බන්ධ ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) A, D සහ E (4) B, C සහ E (5) C, D සහ E

**28.** පහත ප්‍රකාශ අතුරෙන් ශාන්ත බෙනඩික්තුමා සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) ඉතාලියේ නූර්ශියා නගරයේ ප්‍රභූ පවුලක උපත ලැබී ය.
(2) තාපසවරුන් වෙනුවෙන් නීති මාලාවක් සකසනු ලැබී ය.
(3) පනවන ලද නීති මාලාව තාපසවරුන්ට ක්‍රිස්තුන් වහන්සේ තුළ ගොඩනැගුණු ජීවිතයක් ගත කිරීමට ආධාර විය.
(4) පළමු තාපසාරාමය 'මොන්ටෙකසිනෝ' යන ස්ථානයෙහි පිහිටුවී ය.
(5) එතුමන් විසින් පිහිටුවන ලද තාපස නිකායේ ආදර්ශ පාඨය 'යාච්ඤාව සහ ඉගැන්වීම' යන්න ය.

**29.** පහත ප්‍රකාශ අතුරෙන් ගෝත්‍රිකයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තරමක් දියුණු අධ්‍යාපන ක්‍රමයකට හිමිකම් කීහ.
(2) පස්වන සහ හයවන ශත වර්ෂවල දී යුරෝපයේ සෑම ප්‍රදේශයක ම පාහේ ජීවත් වූහ.
(3) ක්‍රිස්තු වර්ෂ හත්වන ශත වර්ෂය වන විට විසිගොත්වරුන් විසින් රෝමය ආක්‍රමණය කරනු ලැබී ය.
(4) කාන්තාවන් ඉතා පහත් තත්ත්වයේ ලා සැලකූහ.
(5) රෝම ගෘහ නිර්මාණ ශිල්පය ආරම්භ කරන ලදී.

**30.** පහත ප්‍රකාශ අතුරෙන් යාචක නිකා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මධ්‍යගත යුගයේ දී යුරෝපය තුළ ආධ්‍යාත්මික නවෝදයක් ගෙනඒම සඳහා ය.
(2) පැවති තාපස ජීවිත ක්‍රමයට විරුද්ධ විය.
(3) යාචක නිකා අතර පළමුවැන්න ප්‍රැන්සිස්කන් පැවිදි නිකායයි.
(4) සාමාජිකයන් විසින් සභාවේ නායකයන් විවේචනය කිරීම නිසා සභාව විසින් යාචක නිකා තහනම් කරන ලදී.
(5) යාචක නිකා පිහිටවනු ලැබුවේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ යුගයේ දී ය.

**31.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය ඇතිවීමට බලපෑ හේතුවක් **නොවන්නේ** කුමක් ද?
(1) සභා නායකයන් ගත කරමින් සිටි ලෞකික ජීවිතය
(2) සභාව සහ ශුද්ධ වූ රෝම අධිරාජ්‍යය අතර පැවති බල අරගලය
(3) සභා නායකයන් දේශපාලන කටයුතුවලට මැදිහත් වීම සහ ලෞකික පාලකයන් සභාවේ කටයුතුවලට අනිසි ලෙස මැදිහත් වීම
(4) සභාව එක් පුද්ගලයකු විසින් පාලනය කිරීමට වඩා සභාවේ පාලනය විමධ්‍යගත කිරීම වඩාත් යෝග්‍යය යන අදහස ඇති වීම
(5) සභාවේ නායකයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් ගිහි විශ්වාසකයන් තුළ කලකිරීමක් ඇතිවීම

**32.** පහත ප්‍රකාශ සලකා බලන්න.

A - නව දේශයන් සොයා ගැනීම

B - පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස පහළ පන්තිවල සිටි ජනයාට සමාජයේ ඉහළ තත්ත්වයක් කරා යාමට හැකියාව ලැබීම

C - සභාව තුළ පැතිරෙමින් තිබූ නව ආකාරයේ වාදභේද

D - සමාජය තුළ පැවති නව චින්තනය

E - පැවිදි නිකා අතර පැවැති ගැටුම්

මේවායින් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට මග පෑදූ දේශපාලන හා සාමාජීය පසුබිම පිළිබඳ නිවැරදි ප්‍රකාශ මොනවා ද?

(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D

(4) B, D සහ E (5) C, D සහ E

**33.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් උල්රිච් ස්විංග්ලීතුමාගේ ඉගැන්වීම් පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සත්‍යය දැනගත හැකි එකම මාර්ගය වන්නේ ශුද්ධ බයිබලයයි. : සක්‍රමේන්තු යනු සංකේත පමණි.

(2) සත්‍යය දැනගත හැකි එකම මාර්ගය වන්නේ ශුද්ධ බයිබලයයි. : දිව්‍ය සත්ප්‍රසාදය තුළ සැබෑ ලෙසම ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින සේක.

(3) සක්‍රමේන්තු යනු සංකේත පමණකි. : ජනප්‍රිය භක්ති අභ්‍යාස පිළිපැදීම ධෛර්යවත් කළේ ය.

(4) 'ශුද්ධගිනිස්ථානය' යන්නක් පවතියි. : පූජක බඹසර රැකීමේ අවශ්‍යතාව පිළිගනු ලැබී ය.

(5) චතාරික උපවාසය දිරිගන්වයි. : පූජක බඹසර රැකීම පිළිගනු ලැබී ය.

**34.** කැපුචින් පැවිදි නිකාය සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) ආරම්භ කරන ලද්දේ ප්‍රැන්සිස්කාන නිකායෙන් වෙන්ව ආ පැවිදිවරයෙකු විසිනි.

(2) කැපුචින් යනුවෙන් හැඳින්වෙන පළඳනාවක් හිසේ පැළඳි නිසා කැපුචින් නිකාය යනුවෙන් හැඳින්වී ය.

(3) අසීසියේ ප්‍රැන්සිස්තුමන් විසින් ආරම්භ කරන ලදී.

(4) සාමාජිකයෝ චාම් ජීවිතයක් ගත කරමින් සාමාන්‍ය ජනතාවට ගැළපෙන ආකාරයට ධර්ම දේශනා කළහ.

(5) හත්වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා ලෝකයේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සහ දේශනා කිරීමට නීත්‍යානුකූල අවසරය දෙන ලදී.

**35.** පළමුවෙන් යුරෝපීය මීසම් පාසල් ආරම්භ කරන ලද පැවිදි නිකාය වන්නේ,

(1) ප්‍රැන්සිස්කානු නිකායයි.

(2) ජේසු නිකායයි.

(3) බෙනඩික්ටානු නිකායයි.

(4) දොමිනිකානු නිකායයි.

(5) අගුස්තිනු නිකායයි.

**36.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ශාන්ත තෝමස් ඇක්වයිනස්තුමන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) 13 වන ශත වර්ෂයේ විසූ දේව ධර්ම ශාස්ත්‍රඥයෙකි

(2) අසීසියේ ප්‍රැන්සිස්තුමන්ගේ අනුගාමිකයෙකි

(3) සභා ඉතිහාසය පිළිබඳ විශාරදයෙකි

(4) බොලොඤ්ඤ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූවෙකි

(5) 'දේව නගරය' නමැති ග්‍රන්ථයේ කතෘවරයායි

**37.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 'ක්‍රිස්තු අනුසාරය' යන ග්‍රන්ථය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) අපර මධ්‍යගත යුගයේ දී ලියන ලද්දකි.

(2) කුරුසියේ ශුද්ධ වූ ජුවාම්තුමා විසින් ලියන ලදී.

(3) බටහිර භාෂාවන්ට පමණක් පරිවර්තනය කර ඇත.

(4) පාප කමාවේ දේව ප්‍රසාද නිධානය පිළිබඳ විස්තර කර ඇත.

(5) ආධ්‍යාත්මික ජීවිතය පහල මට්ටමක පැවති අවධියක ලියන ලද්දකි.

● පහත දක්වෙන වගුවේ **A** සිට **J** දක්වා සඳහන් කරුණු ඇසුරින් **38** සහ **39** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>දේව නගරය<br>(City of God) | B<br>දෙව්ක පින්තාරු කරුවෙක්<br>(Dirine Painter) | C<br>සුම්මා තියෝලොජි | D<br>ඉතාලි සාහිත්‍යයේ පියා | E<br>යහපත් ජීවනයකට මග<br>(The way of Perfection) |
| F<br>ආත්මයේ රාජධානිය | G<br>ජීවිත වාර්තාව<br>(Confessions) | H<br>මෝනාලිසා | I<br>සුම්මා කොන්ත්‍රා ජෙන්තිලෙස් | J<br>දේව සුඛාන්තය<br>(Divine Comedy) |

**38.** අවිලාහි තෙරේසා තුමියට සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A H (2) C J (3) D H (4) E F (5) E J

**39.** දාන්තේ අලිගියෙරිට සම්බන්ධ යුගලය කුමක් ද?
(1) A J (2) B I (3) C G (4) D F (5) D J

**40.** 1960 වසරේ පාසල් රජයට පවරා ගැනීම පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - උසස් විදුහල් 40ක් රජයට පවරා දුනි.
B - දරුවන්ගේ ආගමික අධ්‍යාපනය පිළිබඳ දෙමව්පියන්ගේ උනන්දුව අඩු විය.
C - ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය පිහිටුවන ලදි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) A පමණි. (2) A සහ B පමණි (3) A සහ C පමණි
(4) B සහ C පමණි (5) A, B හා C සියල්ලම

**41.** ඉන්දියානු සභාව තුළ රෝමානු කතෝලික ජන වන්දනා ක්‍රම අනුගමනය කරන සභා මොනවා ද?
(1) සීරෝ මලබාර්, ලතින් හා තෝමස් ක්‍රිස්තියානියන්
(2) සිරියන් ක්‍රිස්තියානි, සීරෝ මලන්කාර හා ජැකොබයිට් සිරියන්
(3) සීරෝ මලන්කාර, සීරෝ මලබාර් හා ඕර්තඩොක්ස් සිරියන්
(4) මලංකාර සිරියන් ඕර්තඩොක්ස්, මාර් තෝමා හා ලතින් සභාව
(5) සිරෝ මලබාර්, සීරෝ මලක්කාර හා ලතින් සභාව

**42.** පිලීපීනයේ ශුභාරංචිය දේශනා කළේ,
(1) ප්‍රංශ ජාතිකයින් ය. (2) ඉතාලි ජාතිකයින් ය.
(3) උතුරු අමෙරිකානු ජාතිකයින් ය. (4) පෘතුගීසි ජාතිකයින් ය.
(5) ස්පාඤ්ඤ ජාතිකයින් ය.

**43.** පෘතුගීසි සමයේ දී ශ්‍රී ලංකාවේ ධර්මදූත සේවාවෙහි යෙදුණු පැවිදි නිකායන් හතර මොනවා ද?
(1) ප්‍රැන්සිස්කාන, බෙනදිකාන සොමස්කන් හා ජේසු නිකායික
(2) ප්‍රැන්සිස්කාන, ජේසු නිකායික, දොමිනිකාන හා අගුස්තියාන
(3) නිමල මරිය, දොමිනිකාන, ක්ලැරිෂියක් හා අගුස්තියාන
(4) අගුස්තියාන, ප්‍රැන්සිස්කාන, බෙනදිකාන හා සැලේසියාන
(5) සැලේසියාන, ජේසු නිකායික, ප්‍රැන්සිස්කාන හා දොමිනිකාන

**44.** බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පාසල් වර්ග මොනවා ද?
(1) මිෂන් පාසල්, සෙමිනරි පාසල් හා රජයේ පාසල්
(2) රජයේ පාසල්, පිරිවෙන් පාසල් හා අනාථ පාසල්
(3) සෙමිනෙරි පාසල්, දේවස්ථාන පාසල් හා මිෂන් පාසල්
(4) රජයේ පාසල්, මිෂන් පාසල් හා පිරිවෙන් පාසල්
(5) රජයේ පාසල්, සෙමිනරි පාසල් හා පිරිවෙන් පාසල්

**45.** ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය යටතේ ක්‍රියාත්මක වන සමාජ සේවා ආයතනය කුමක් ද?
(1) කරිටාස් ශ්‍රී ලංකා සෙඩෙක් (SEDEC)
(2) තරුණ ක්‍රිස්තියානි සංගමය
(3) තරුණ ක්‍රිස්තියානි කාන්තා සංගමය
(4) ග්‍රීන් ආරෝග්‍ය ශාලාව
(5) රොටරි සමාජය

**46.** සමාජ සාධාරණත්වය ඉටු කිරීම සම්බන්ධයෙන් හඬ නැගූ ඇන්ග්ලිකානු සභා නායකයා කවුරුන් ද?
(1) ලියෝ නානායක්කාර රදගුරුතුමා (2) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා
(3) මයිකල් රුද්‍රිගු පියතුමා (4) මේරි බැස්ටියන් පියතුමා
(5) එච්.එස්. ඩේවිඩ් පියතුමා

**47.** පරිසරය සුරැකීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ විශ්ව ලේඛනය තෝරන්න.
(1) ලෝක සාමය - Pacem in Terries
(2) මනුෂ්‍යයන්ගේ ගැළවුම්කරුවාණෝ - Redemptor Hominis
(3) සභාවේ සමාජ සහභාගිත්වය - Solicitudo Rei Socialis
(4) ප්‍රශංසා වේවා මා සමිඳුනි - Laudato Si
(5) ජනතා ප්‍රගතිය - Populorum Progressio

**48.** සභා සංවිධාන සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න.
A - 1957 දී බොම්බායෙහි ආරම්භ වූවකි.
B - 1957 දී ඉන්දුනීසියාවේ ආරම්භ වූවකි.
C - බෙඳුණු සභා 100කට අධික ප්‍රමාණයක් ඒකාබද්ධ වූ සංවිධානයකි.
D - ශ්‍රී ලංකාව සාමාජික රටකි.
E - ආසියාව තුළ ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීම එක් පරමාර්ථයකි.
මේවායින් ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය (ACC) සම්බන්ධ ප්‍රකාශ මොනවා ද?
(1) A, B සහ C (2) A, B සහ D (3) B, C සහ D (4) B, D සහ E (5) C, D සහ E

**49.** කම්කරු ශ්‍රමයේ උදාරත්වය පිළිබඳ විශ්ව ලේඛනය ලියන ලද ශුද්ධෝත්තම පියතුමා කවුරුන් ද?
(1) XIII වන ලියෝ (2) XXIII වන ජුවාම්
(3) VI වන පාවුලු (4) II වන ජුවාම් පාවුලු
(5) XVI වන බෙනඩික්

**50.** අන්තර් ආගමික සබඳතාව පිළිබඳ සාකච්ඡා කර ඇති දෙවන වතිකානු කතිකාවේ ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) ශුද්ධ වූ සභාව, ජනවන්දනාව, සභාවේ ධර්මදූත සේවාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව
(2) ශුද්ධ වූ සභාව, ජනමාධ්‍ය, ක්‍රිස්තියානි නොවන ආගම් සමඟ සභාවේ සම්බන්ධතාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව
(3) ශුද්ධ වූ සභාව, ක්‍රිස්තියානි ආගමික අධ්‍යාපනය, ක්‍රිස්තියානි නොවන ආගම් සමඟ සභාවේ සම්බන්ධතාව, සභාවේ ධර්මදූත සේවාව
(4) ශුද්ධ වූ සභාව, දේව ප්‍රකාශනය, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව, ක්‍රිස්තියානි එකමුතුකම
(5) ශුද්ධ වූ සභාව, නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව, සභාවේ ධර්මදූත සේවාව, ක්‍රිස්තියානි නොවන ආගම් සමඟ සභාවේ සම්බන්ධතාව

***

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

| විෂයය අංකය<br>பாட இலக்கம் | 49 | විෂයය<br>பாடம் | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 5 | 11. | 4 | 21. | 2 | 31. | 4 | 41. | 5 |
| 02. | 4 | 12. | 3 | 22. | 5 | 32. | 2 | 42. | 5 |
| 03. | 2 | 13. | 3 | 23. | 3 | 33. | 1 | 43. | 2 |
| 04. | 4 | 14. | 5 | 24. | 2 | 34. | 3 | 44. | 4 |
| 05. | 4 | 15. | 1 | 25. | 4 | 35. | 3 | 45. | 1 |
| 06. | 5 | 16. | 3 | 26. | 3 | 36. | 3 | 46. | 2 |
| 07. | 2 | 17. | 2 | 27. | Open | 37. | 2 | 47. | 4 |
| 08. | 5 | 18. | 5 | 28. | 5 | 38. | 4 | 48. | 3 |
| 09. | 3 | 19. | 5 | 29. | 2 | 39. | 5 | 49. | 1 |
| 10. | 2 | 20. | 3 | 30. | 1 | 40. | 3 | 50. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

AL/2019/49/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය II
கிறிஸ்தவ நாகரிகம் II
Christian Civilization II

49 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ශුද්ධ වූ සුවිශේෂවල අන්‍ය ජාතිකයන් පිළිබඳ ව සඳහන් වන අවස්ථා **හතරක්** සඳහන් කරන්න.
(ii) ශ්‍රාවකත්වය පිළිබඳ ව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් **හතරක්** ලියන්න.
(iii) කන්ද උඩ දේශනයෙහි සඳහන් වන දේව රාජ්‍යය පිළිබඳ වටිනාකම් **හතරක්** සඳහන් කරන්න.
(iv) දේව රාජ්‍යයෙහි ස්වභාවය පිළිබඳ ව කියැවෙන උපමා කථා **හතරක්** දක්වන්න.
(v) ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසියෙහි ඇණ ගැසීම පිළිබඳ ව සුවිශේෂයන්හි සඳහන් කරුණු **හතරක්** ලියන්න.
(ලකුණු 4 × 5 = 20 යි)

**2.** (i) වේදභේද **හතරක්** ඒවායේ මූලික ඉගැන්වීම් ද සහිතව සඳහන් කරන්න.
(ii) කුරුස යුද්ධවල යහපත් සහ අයහපත් ප්‍රතිඵල **දෙක** බැගින් ලියන්න.
(iii) සභාවේ දේවධර්මීය සහ ආධ්‍යාත්මික උන්නතිය සඳහා මුල් ක්‍රිස්තියානි චින්තකයන්ගේ දායකත්වයන් **හතරක්** ලියන්න.
(iv) ශාන්ත අගුස්තීනුතුමන්ගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳ ව කරුණු **හතරක්** සඳහන් කරන්න.
(v) ඇලෙක්සැන්ඩ්‍රියානු විද්‍යා පීඨයේ ඉගැන්වීම් සම්බන්ධ කරුණු **හතරක්** ලියන්න.
(ලකුණු 4 × 5 = 20 යි)

**3.** (i) ඉන්දියාවේ ලතින් සභාවේ ලක්ෂණ **හතරක්** ලියන්න.
(ii) මාර් තෝමා සභාවේ ආරම්භය පිළිබඳ කරුණු **හතරක්** ලියන්න.
(iii) ජපානයේ සභාව ආරම්භ කිරීමේ දී ජේසු නිකායෙන් ලද දායකත්වයන් **හතරක්** ලියන්න.
(iv) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ධර්මය පැවැති බවට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න.
(v) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වර්ධනය කිරීමෙහි ලා බොන්ජින් රදගුරුතුමන්ගෙන් සිදු වී ඇති සේවාව පිළිබඳ ව කරුණු **හතරක්** සඳහන් කරන්න.
(ලකුණු 4 × 5 = 20 යි)

## II කොටස

**4.** (i) ශුද්ධ වූ පාවුලුතුමන්ගේ ලිපිවල 'දේව වරප්‍රසාදය' පිළිබඳ ව සඳහන් ඉගැන්වීම් ඇතුළත් සංක්ෂිප්ත රචනයක් ලියන්න.
(ii) දේව වරප්‍රසාදයෙන් පුරවා ඇති ක්‍රිස්තියානීහු, දෙවියන් වහන්සේගේ මැවිල්ලක් වන පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කරන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.
(ලකුණු 10 × 2 = 20 යි)

**5.** (i) ක්‍රි.ව. 1054 දී සභාව පෙරදිග සහ අපරදිග වශයෙන් බෙදී වෙන් විය. මෙකී බෙදීමට හේතු වූ නායකත්වය පිළිබඳ ව සහ දේව ධාර්මික කරුණු විස්තර කරන්න.

(ii) සභාව ලෝකය තුළ දේව රාජ්‍යයේ සලකුණක් වන පිණිස ක්‍රිස්තියානි එකමුතුකමේ ඇති අවශ්‍යතාව පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**6.** (i) ආසන දේව මන්දිර ආශ්‍රිත ව ගොඩනැගු පාසල් අධ්‍යාපනය යුරෝපීය සමාජයට ලබාදුන් සාධනීය දායකත්ව අගයන්න.

(ii) රටක බහු ආංශික අභිවෘද්ධියය සඳහා පාසල් අධ්‍යාපනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**7.** (i) ශ්‍රී ලංකාවේ පෘතුගීසි පාලන සමයේ කතෝලික ධර්මයේ උන්නතිය උදෙසා සාහිත්‍යය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, රංග කලාව ආදිය උපයෝගී කරගත් ආකාරය සාකච්ඡා කරන්න.

(ii) වර්තමානයේ සමාජය තුළ ක්‍රිස්තියානි වටිනාකම් ප්‍රචලිත කිරීම සඳහා සාහිත්‍ය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව සහ සමාජ මාධ්‍යය ආදිය යොදගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

**8.** (i) විවාහ ජීවිතය සහ පවුල සම්බන්ධයෙන් දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ 'නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව' ප්‍රකාශයේ සඳහන් ඉගැන්වීම් මොනවා දැයි විස්තර කරන්න.

(ii) ක්‍රිස්තියානි පවුල තුළ වර්ධනය වෙමින් පවතින ගැටුම් හා ව්‍යාකූලත්වය හමුවේ ප්‍රීතිමත් සහ යහපත් පවුල් ජීවිතයක් ගොඩනැගීමට දරුවන්ගේ භූමිකාව පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 10 × 2 = 20 යි)

* * *

**01. i. ශුද්ධ වූ සුවිශේෂවල අන්‍ය ජාතිකයන් පිළිබඳ ව සඳහන් වන අවස්ථා හතරක් සඳහන් කරන්න.**

- ජේසුස් වහන්සේ උපන් කළ ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම
- ක්‍රිස්තුත් වහන්සේ සමරිතානුවරු සමග සම්බන්ධය
  - සමරිතානු ස්ත්‍රිය පිළිබඳ කථාව
  - ලාදුරු රෝගීන් දස දෙනා පිළිබඳ කතාව
  - යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාව
  - සමරියාවේ නගර හරහා යාම
- අසාධාරණ විනිශ්චයකාර හා වින්නඹුව
- සුවය ලැබූ ලේ මාලය රෝගයෙන් පීඩා විඳි කාන්තාව
- සිරෙෆිනියන් කාන්තාවගේ දියණිය සුවපත් කිරීම
- ශතාධිපතියාගේ දාසයා සුවපත් කිරීම
- ජෙරුසලමේ දී ග්‍රීකවරු හා හමුවීම
- සියලු දෙනාටම සුභාරංචිය පතළ කිරීම

**ii. ශ්‍රාවකත්වය පිළිබඳව ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් හතරක් ලියන්න.**

- ශ්‍රාවකයන්ට තෝරා ගන්නේ ක්‍රිස්තුත් වහන්සේමය
- තමකම නසා කුරුසය දරාගෙන ක්‍රිස්තුත් වහන්සේ පසුපස යාම
- ප්‍රථමයා වීමට කැමැත්තේ අන්තිමයා වීම (මාක් 8:31-33)
- සේවය ලැබීම නොව සේවය කිරීම (මාක් 9:33:37)
- ක්‍රිස්තුස් වහන්සේ බොන කුසලානෙන් බීමට සූදානම (මාක් 10:35:4)
- අන් අයගේ පාද දෝවනය කිරීමට සූදානම්ව සිටීම (ජොතන් 13:1-16)
- බැගැපත්ව කරන සේවාව

**iii. කන්ද උඩ දේශනයෙහි සඳහන් වන දේව රාජ්‍ය පිළිබඳ පිළිබඳව කියැවෙන වටිනාකම් හතරක් දක්වන්න.**

- වටිනාකම් : ප්‍රේමය, දයාව, සාධාරණකම, යුක්තිය වැනි දේ
- මෙලොව වටිනාකම්වලට වඩා වෙනත් වටිනාකම් වීම
- ලෝකයට ආලෝකයක් වීම - ආලෝකය සැමවිටම අන් අයගේ ජීවිතයට එළියක් ගෙන එයි.
- ලුණු ජීවිතය රසවත් කරයි. අප අන් අයගේ ජීවිත රසවත් කිරීමට කැපවීම
- කෝපවීමෙන් වැළකී සිටීම
- පළි නොගැනීම - එය අන් අයගේ ජීවිත විනාශ කරයි.
- කාමමිත්‍යාචාරයෙහි නොයෙදීම
- සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම
- දන් දීම - මනස්ථාපනයට හේතුවන උපවාසය
- යාච්ඤාව - අන් අය අප වෙනුවෙන් කරනවාට කැමති දේ ඔවුන් වෙනුවෙන් කිරීම

**iv. දේව රාජ්‍යයෙහි ස්වභාවය පිළිබඳ ව කියැවෙන උපමා කථා හතරක් දක්වන්න.**

- අබ ඇටය පිළිබඳ උපමාව
- මුහුන් පිළිබඳ උපමාව
- නිධානයක් හමුවීම පිළිබඳ උපමාව (මුතු ඇටය සහ සැගවුණු නිධානය උපමා කථාව)
- මුහුදට හෙළු දැල පිළිබඳ උපමාව
-

**v. ක්‍රිස්තුත් වහන්සේගේ කුරුසියෙහි ඇණ ගැසීම පිළිබඳව සුවිශේෂයන්හි සඳහන් කරුණු හතරක් ලියන්න.**

- කුරුසියේ හිසට ඉහලින් ග්‍රීක රෝම හීබෲ භාෂාවලින් මරණයට හේතුව ලිවීම
- කුරුසියේ මරණයට වගකිව යුත්තෝ රෝමවරු නොව ජුදෙව්වරුය
- ක්‍රිස්තුත් වහන්සේ තම දුක් විඳීම සහ මරණය එඩිතරව සහ කැමැත්තෙන් භාර ගත් සේක.
- දෙව් පියාණන්ගේ කැමැත්ත එලෙස ඉටුකිරීමට කැමති වීම
- ක්‍රිස්තුත් වහන්සේගේ කුරුසිය පාමුල මරිය තුමී, එතුමියගේ සොහොයුරිය ජුවාම්තුමා, මරිය මග්දලේනාතුමිය සිටි බව
- තම හිස නමා අවසන් හුස්ම හෙළු බව
- ක්‍රිස්තුත් වහන්සේගේ මරණයෙන් පියාණන් මහිමාතාවට පත් වූ බව
- අරමිතියාවේ ජෝෂප් සහ නිකදේමුස් එක්ව දේහය ගල් ලෙනෙහි තැන්පත් කිරීම

**2. i. වේදභේද හතරක් ඒවායේ මූලික ඉගැන්වීම් ද සහිතව සඳහන් කරන්න.**

- එරියන් වාදය ් වචනය දෙවියන් වහන්සේට වඩා පහත් බව
- නෙස්ටොරියානු වාදය - ක්‍රිස්තුත් වහන්සේ දෙවියන් වහනසේ නොවන බව හා එම නිසා මරියතුමිය දෙවියන් වහන්සේගේ මව නොවන බව
- යුනිකේය වාදය - ක්‍රිස්තුත් වහන්සේට එක් ස්වාභාවයක් පමණක් ඇති බව මනුෂ්‍ය ස්වභාවය දේව ස්වභාවය තුළ සැගවී ඇති බව
- මැසදෝනියා වාදය - පුත්‍රයාණන් හා ශුද්ධෝත්මයන් දෙවියන් නොවන බව
- මැනකියානු වාදය - ආලෝකය සහ අඳුර වශයෙන් රාජ්‍යයන් දෙකකි. ආලෝකයේ රාජ්‍ය දෙවියන් සතුය. අන්ධකාරයේ රාජ්‍ය යක්ෂයා සතුය.
- පෙලජියානු වාදය
- ඩොනටියානු වාදය

**ii. කුරුස යුද්ධවල යහපත් සහ අයහපත් ප්‍රතිඵල දෙක බැගින් ලියන්න.**

- ජනතාව අතර ගැළවීම පිළිබඳ අදහසට නව ජීවයක් ලැබීම
- සභාවේ සමගියට රෝමයේ වැදගත්කම අවබෝධ කිරීම
- කිතුනු ගෝත්‍ර අතර ඇති වූ සටන් අවසන් වීම
- වහල් වෙළඳාම අහෝසි වීම
- නව පැවිදි පන්ති ඇති වීම

අයහපත් ප්‍රතිපල

- ශුද්ධ වූ දේශයට වන්දනාකරුවන් නිදහසේ යාමේ අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වීම
- අපරදිග කිතුනුවන්ගේ බලය තවත් හීනවීම
- යුද්ධයට ආධාර දුන් රජවරුන් සභාව කෙරෙහි බලපෑම් කිරීම
- කිතුනු ඇදහිල්ලේ පසුබෑමක් ඇති වීම
- විශාල ලෙස ජීවිත හා දේපල විනාශ වී යාම

**iii. සභාවේ දේව ධර්මීය සහ අධ්‍යාත්මික උන්නතිය සඳහා මුල් ක්‍රිස්තියානි චින්තකයන්ගේ දායකත්වයන් හතරක් ලියන්න.**

- පීඩන මැද කිතුනු භක්තිකයන් ශක්තිමත් කිරීම හා විශ්වාසයෙහි ස්ථිර කිරීම
- ක්‍රිස්තියානීන් සම්බන්ධයෙන් පතල වෙමින් තිබූ මිත්‍යා මතවලට පිළිතුරු දෙමින් ක්‍රිස්තු ධර්මය සාධාරණීකරණය කරමින් පොතපත ලියූහ.
- ක්‍රිස්තියානි සත්‍යතා නිවැරදිව පැහැදිලි කරදීම
- ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල්තුමා බහු දේව වන්දනාව වැරදි බව පෙන්වා දෙමින් කිතුනු දේව විශ්වාසය පැහැදිලි කිරීම
- රෝම බහු විශ්වාසයන්ට විරුද්ධව ඒකදේව වාදය ගැන ලිවීම
- ඔරිගන්තුමන් විසින් සෙවරිස් අධිරාජ්‍යාගේ සමයේදී සිරගතව සිටි ක්‍රිස්තියානින් බලන්නට යමින් ඔවුන් ධෛර්යමත් කිරීම
- ඔරිගන්තුමන් කිතුනු භක්තිය වැළඳගත් නවකයින් ධෛර්යමත් කිරීම
- ඔරිගන්තුමන් ක්‍රිස්තු භක්තිය සම්බන්ධයෙන් බෙහෝ පෙතපත සහ ලිපි ලවීම
- ජස්ටින්තුමන් කිතු දහමට විරුද්ධ වූ අදහස් ප්‍රතික්ෂේප කරමින් බොහෝ පොතපත ලිවීම
- ජස්ටින්තුමා ක්‍රිස්තියානීන්ට පීඩා කිරීමට පෙර ඔවුන් ගැන වූ චෝදනා හොඳින් අධ්‍යයනය කළ යුතු බව තම ඇපලොජියා ග්‍රන්ථය මගින් පැවසීම
- ක්‍රිස්තුත් වහන්සේ සැබෑ මෙසියස් තුමා බවත් උන්වහන්සේ කියූ දෙය සඳහටම බලපෑ බවත් ජුදා ජාතිකයන් සමග සංවාදෙය් ග්‍රන්ථයේ සඳහන් කිරීම
- ටර්ටුලියන් තුමා - ලතින් භාෂාවෙන් කිතුනු ග්‍රන්ථ ලිවීම
- කිතුනු විශ්වාසය ආරක්ෂා කිරීම

- ඉරේනියස් තුමා - දර්ශනය හා ග්‍රීක භාෂාව ඉගෙනගෙන දර්ශනය මගින් කිතුනු දේවධාර්මික අදහස් විස්තර කිරීම
- නොස්ටික් වාදයේ වැරදි පෙන්වා දීම

**iv. ශාන්ත අගුස්තීනුතුමන්ගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳ ව කරුණු හතරක් ලියන්න.**

- උතුරු අප්‍රිකාවේ තගස්තෙහි ක්‍රි.ව. 354 උපත
- කාර්තේජහි නීතිය හැදෑරීම
- ලතින් සභා පියතුමෙකි
- පෙලජියානු වාදය, ඩොනටියානු වාදය, වැනි භේදභේදවල වැරදි පෙන්වා දී සැබෑ කිතුනු ධර්මය පැහැදිලි කිරීම
- ශුද්ධ වු ත්‍රිත්වය පිළිබඳවත්, වරප්‍රසාදය සහ පාපය පිළිබඳවත් ග්‍රන්ථ සම්පාදනය කිරීම කිරීම හා ඉගැන්වීම
- සිත් හැරීම (Confestion) පිළිබඳ ග්‍රන්ථයක් ලිවීම
- දේව නගරය පිළිබඳ ග්‍රන්ථය ලිවීම
- ශුද්ධ වූ ත්‍රිත්වය ග්‍රන්ථය මගින් මූල ජීවසාරය, බවත්වය ජනිතවීම වැනි ගැඹුරු දාර්ශනික වචනවල සැගවී ඇති අරුත් පහදා දීම
- ප්ලැතෝනික වාදය සහ ශුද්ධ වූ බයිබලය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරදීම
- ප්ලේටෝ දර්ශනය අනුගමනය කිරීම

**v. ඇලෙක්සැන්ඩ්‍රියානු විද්‍යා පීඨයේ ඉගැන්වීම් සම්බන්ධ කරුණු හතරක් ලියන්න.**

- අන්තියෝකියේ පූජකතුමකු වූ ලුසියන් නැමැත්තා විසින් මෙම විද්‍යා පීඨය ආරම්භ කර ඇත
- ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය වඩාත් ඉස්මතු කොට දැක්වීම
- ප්ලෝටෝ නැමැති ග්‍රීක දාර්ශනිකවාදියාගේ මත අනුගමනය කිරීම
- ඒරියන් වාදයට විරුද්ධව ක්‍රිස්තුවේදය ඉදිරිපත් කිරීම
- ජොහාන්තුමාගේ ශුභාරංචිය මත ක්‍රිස්තුවේදය ඉදිරිපත් කිරීම
- ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ ඉගැන්වීම් තුන්දෙනා වහන්සේලාගේම දේවත්වය පිළිගැනීම
- ව්‍යාංගාර්ථයෙන් ශුද්ධ වූ ලියවිලි විග්‍රහ කිරීම
- ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා හා ඔරිගන්තුමා එහි මූලිකයෝ වූහ.

**3. i. ඉන්දියාවේ ලතින් සභාවේ ලක්‍ෂණ හතරක් ලියන්න.**

- පූජකතුමකු සමග මීසම් ජීවිතය
- බටහිර වන්දනා ක්‍රම පිළිපැදීම
- භක්ති අභ්‍යාසය, මංගල්‍ය හා වන්දනා ක්‍රම ආදියට ප්‍රමුඛස්ථානයක් දීම
- සාන්තුවර බැතිය සහ වන්දනා ගමන්
- ඉන්දියාවේ කිතුනු සභා අතර වැඩිම සාමාජිකත්වය දරන සභාව වීම

- ඉන්දියාව පුරා විසිර ඇති එකම කිතුනු සභාව වීම
- දේශානුරූපී වීමට උත්සාහයක යෙදී සිටියි
- ඉන්දියාවේ අධ්‍යාපනය, සෞඛ්‍ය සේවාව ආදියට විශාල දායකත්වයක් සපයයි
- සාමාජිකයන්ගෙන් වැඩි දෙනා ඉන්දියානු සමාජය විසින් කුලහීනයක් බවට සලකන්නන්ගෙන් යුක්ත වීම

**ii. මාර් තෝමා සභාවේ ආරම්භය පිළිබඳ කරුණු හතරක් ලියන්න.**

- ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ සමයේ ඇරඹුමකි
- මුල් අවධියේ දී ඉන්දියාවේ ඇන්ගිලිකානු සභාව සමග සමීප සබඳතාවයකින් කටයුතු කර ඇත
- සභාව තුළ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම හේතු කොටගෙන එය කොටස්වලට බෙදුණි
- මලංකාර වෛදික සභාවෙන් වෙන් වී මාර්තෝමා සභාව නමින් වෙනමම සභාවක් ඇති වූයේ 1886 දීය
- දැනට එහි සාමාජිකයෝ මිලියනයක් පමණ සිටිති
- රෙපරමාදු දහම් සේවයේ කිතුනුවන් හා සිරියානු කතෝලිකයන් අතර ඇති වූ සබඳතාවය නිසා මෙම සභාව ඇති විය

**iii. ජපානයේ සභාව ආරම්භ කිරීමේ දී ජේසු නිකායෙන් ලද දායකත්වයන් හතරක් ලියන්න.**

- ජපානයට පළමුව පැමිණි ධර්මදූතවරු වශයෙන් සලකන්නේ ජේසු නිකායික ධර්ම දූතවරුය. (නිදසුන් ශු.ප්‍රැන්සිස් සේවියර් තුමා)
- නාගසාකි නගරයේ ධර්ම දූත ස්ථානයක් පිහිටුවා කිතුනු ධර්ම ප්‍රචාරයෙහි යෙදුනාහ.
- ජේසු නිකායික පියවරු ජපානයේ අධ්‍යාපනයේ දියුණුව සඳහා මහත් සේවාවක් කර ඇත.
- තාක්ෂණික අධ්‍යාපනය ද දියුණු කළහ.
- 1587 ජපානයේ දී ධර්මදූතවරුන්ට පිටවීමට සිදු වේ.

**iv. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ධර්මය පැවති බවට සාධක හතරක් ඉදිරිපත් කරන්න.**

- ඉව්වෂාප්, අබ්සාකිබ් සහ බෙනජමින් රෆායි වැනි ලේඛකයෝ අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ ජුදා ක්‍රිස්තියානීන් සිටි බව සඳහන් කර ඇත.
- තෝමස් ඉන්ඩෝප්ලෙටස් නැමැති විදේශික ලේඛකයා (ග්‍රීක වෙළෙන්දෙකි - පසුව තාපසවරයකු වී ඇත) තම කිතුනු සභා විවරණය යන ග්‍රන්ථයේ අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ ජුදා ක්‍රිස්තියානීන් සිටි බව සඳහන් කර ඇත.
- සිංහල හමුදාවේ මිගාර නැමැති කිතුනු සෙන්පතියකු සිටි බව 5 වන සියවසේ ලියැවුණු මහා වංශයේ සඳහන් වේ.
- 1912 දී කළ පුරා විද්‍යා කැනීම්වලදී අනුරාධපුර යුගයේ ගොඩනැගිලි සුන්බුන් අතර පර්සියන් කුරුසිය සහිත ගල් පුවරුවක් හමු වී ඇත.

- කාශ්‍යප සහ මුගලන් යන රජවරුන්ගේ සේනාවල කිතුනු යුද්ධ භටයන් සිටි බව මහාචාර්ය පරණවිතාන මහතා තම සීගිරිය ග්‍රන්ථයේ සඳහන් කරයි.
- 9 වන ශතවර්ෂයේ සීගිරි යුගයේ රාජ්‍ය සභාවේ කිතුනු ඇමතිවරුන් සිටි බව සඳහන් වෙයි.
- වවුනියාව පුරා විද්‍යාගාරයේ ගලින් නිම වූ අනුරාධපුර යුගයට අයත් බෞතිස්ම පොකුණක් ඇත.

**v. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වර්ධනය කිරීමෙහි ලා බොන්ජීන් රදගුරුතුමන්ගෙන් සිදු වී ඇති සේවාව පිළිබඳ ව කරුණු හතරක් සඳහන් කරන්න.**

- 1860 දී ශ්‍රී ලංකාවේ 'අධ්‍යාපනය පිළිබඳ සුළු වචන කීපයක්' යන නමින් ලිපියක් පළ කිරීම
- මෙම ලිපියේ ප්‍රතිඵලයක් ලෙස දෙමාපියන් දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව අවධානය යොමු කළ අතර මෙරට ආගමික පාසල් ඇති කිරීමට ද පියවර ගැණුනි.
- එතුමාගේ නිර්මාණශීලී අදහස් රජය පිළිගත් අතර ඒවා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය සඳහා යොදා ගැනීම
- ආගමික අධ්‍යාපන සහ සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන් විශාල සේවාවක් කිරීම
- යාපනයේ ශාන්ත මාර්ටින් කුඩා දෙව්සත්හළ ආරම්භ කිරීම
- 1876 දී ' පදුගාවලන්'නැමැති දෙමළ පුවත්පත ඇරඹීමට පියවර ගැනීම
- කොළඹ ශාන්ත බර්නාඩ් දෙව්සත්හල ආරම්භ කිරීම
- 1884 දී මග්ගොන කාර්මික විදුහල ආරම්භ කිරීම
- කොළඹ ශාන්ත ජෝෂප් විද්‍යාලය ආරම්භ කිරීමට පියවර ගැනීම
- ජනවන්දනාවට අවශ්‍ය පොතපත ලිවීම
- බොහෝ දේවස්ථාන ගොඩ නැගීම

## II පත්‍රය II කොටස

**4. i. ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපිවල 'දේව වරප්‍රසාදය' පිළිබඳ ව සඳහන් ඉගැන්වීම් ඇතුළත් සංක්ෂිප්ත රචනයක් ලියන්න.**

ශුද්ධ වූ පාවුළුතුමන්ගේ දේව වරප්‍රසාදය පිළිබඳ ඉගැන්වීම් අපට හමුවන්නේ එතුමන්ගේ රෝම සහ ගලාති යන හසුන්වලයි. ශුද්ධ වූ පාවුළුතුමා දේව වරප්‍රසාදය යන්නට භාවිත කරන්නේ 'කාරිස්' යන ග්‍රීක වචනයයි. එය අර්ථය දේව දයාව, දේව ප්‍රේය යන්නයි. එතුමන් ඉතාමක් උගත් ව්‍යවස්ථාව හොඳින් දත් පරිසිවරයකි. එතුමා ව්‍යවස්ථාව හොඳින් දැන සිටියා පමණක් නොව එය හැකිතාක් වෙරදරා පිළිපැදීමටද උත්සාහ කළේය. එදා ජුදා ජාතිකයන්ගේ අදහස වූයේ කෙනෙකු ධර්මිෂ්ට වන්නෙත් දෙවියන් වහන්සේ ඉදිරියේ ප්‍රසන්න වන්නේත් ව්‍යවස්ථාව පිළිපැදීමෙන් බවයි. එහෙත් සත්‍ය නම් එය යහපත, අයහපත, කළ යුත්තේ කුමක්ද, නොකළ යුත්තේ කුමක් දැයි පැහැදිලි කළා මිස කෙනෙකු යහපත කරා මෙහෙයවීමක් සිදු නොකළේය. දමස්කස් අත්දැකීමෙන් අනතරුව පාවුළුතුමන්ගේ අදහස මුළුමණින්ම වෙනස් විය. කෙනෙකු ධර්මිෂ්ඨ වන්නේ දෙවිඳුන්ට ප්‍රසන්න වන්නේත් ව්‍යවස්ථාව පිළිපැදීමෙන් නොව ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීමෙනි. අප වරප්‍රසාදය කරා මෙහෙය වන්නේ ක්‍රිස්තුන්

වහන්සේයි. පාපය අතහැර ක්‍රිස්තුත් වහන්සේ තුළ විශ්වාසයෙන් ජීවත් වීම අප ධර්මිෂ්ඨ වීමෙන් දෙවිඳුන්ට ප්‍රසන්න වීමත් සිදුවන බව ශුද්ධ වූ පාවුළුතුමා අවධාරණය කරයි.

**ii. දේව වරප්‍රසාදයෙන් පුරවා ඇති ක්‍රිස්තියානීහු, දෙවියන් වහන්සේගේ මැවිල්ලක් වන පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.**

ලෝකය මවන්නේත්, මනුෂ්‍යයා මවන්නේත් දෙවියන් වහන්සේයි. දෙවියන් වහන්සේ ලෝකය පූර්ණත්වයට ගෙන ඒමේ කාර්යය භාර දෙන්නේ මනුෂ්‍යාටයි. ක්‍රිස්තුත් වහන්සේ මෙලොවට පැමිණියේ මනුෂයා පමණක් ගැලවීමට නොවේ. මනුෂ්‍යා සමග මුලු විශ්වයම ගලවා ගැනීමටය. උන්වහන්සේ එය කලාක් මෙන්, ශුද්ධ වූ පාවුළු තුමා පවසන ලෙසට ලෝකය තුළ සමගිය ඇති කිරීමේ කාර්යය පවරා ඇත්තේ අපටය. මනුෂ්‍යයාට ප්‍රේම නොකර දෙවියන්ට ප්‍රේම කිරීමට නොහැකි සේ දෙවියන් වහන්සේ මැවූ ලෝකය ආරක්ෂා නොකොට එය පූර්ණත්වය කරා ගෙනයාමට කටයුතු නොකොට අපට දෙවියන් වහන්සේට සේවය කිරීමට හෝ ප්‍රේම කිරීමට නොහැකිය. පරිසරය ආරක්ෂා නොකොට මනුෂ්‍යාට පැවතිය නොහැකි බව අප වටහා ගත යුතුය. ජලය ඉතාම අවශ්‍ය දෙයකි. ජලයෙන් තොරව අපට ජීවත් විය නොහැකිය. මේ නිසා ජලය අරක්ෂා කිරීම, ජලය අපිරිසිදු වීමට ඉඩ නොතැබීම අපගේ යුතුකමකි. ජලය ඇති පමණ පැවතීමට බීමට නම් ගස්වැල් තිබිය යුතුය. අපට මහා වනාන්තර මැවිය නොහැකිය. එහෙත් අප අවට තිබෙන ගස්වැල් ආරක්ෂා කිරීම. හැකි පමණින් එක් පැළයක් සිටවීම කළ හැකිය. වාතය පිරිසිදුවීමට ගස්වැල් වලද දායකත්වය ලැබේ. ඒ නිසා පාර දෙපස වවා ඇති පැල ආරක්ෂා කිරීම අපගේ යුතුකමකි. එලෙසම ලෙඩ රෝග ඇතිකරවන වාතය අපිරිසිදු කරන කැලි කසළ සැමතැනම දැමීමක් නොකළ යුතුය. මෙවැනි දේ හැකි පමණින් කිරීමෙන් දෙවිඳුන්ටත් මනුෂ්‍යයන්ටත් ප්‍රසන්න ජීවිතයක් ගත කළ හැකිවන අතර දේව ප්‍රේමයට ද පාත්‍රවනු ඇත. ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පියතුමන් විසින් පරිසරය රැකීම පිළිබඳව Laudate si' ප්‍රශංසාවේ මා සමිඳුනි' යන විශ්ව ලේඛය ලියා පරිසරය රැකීමේ අවශ්‍යතාවය පෙන්වා දුන්නේය.

**5. i. ක්‍රි.ව. 1054 දී සභාව පෙරදිග සහ අපරදිග වශයෙන් බෙදී වෙන් යවි. මෙකී බෙදීමට හේතු වූ නායකත්වය පිළිබඳව සහ දේව ධාර්මික කරුණු විස්තර කරන්න.**

කොන්ස්තන්තීනු අධිරාජ්‍ය විසින් රෝම අධිරාජ්‍යයේ අගනුවර කොන්ස්තන්තිනෝපල් නගරයේ පිහිටුවීමත් සමගම පෙරදිග හා අපරදග යන සභා භේදයක් හටගැනීමේ ආරම්භය ඇති විය. මෙම ගැටුම නායකත්වය පිළිබඳ මෙන්ම සභාවේ දේව ධර්මීය අදහස් හා ජන වන්දනා පිළිවෙත් දක්වා පැතිර ගියේය. කාලයත් සමග කොන්සන්තිනෝපල් සභා නායකතුමන්ගේ බලය වැඩි වූ අතර එතුමා රෝමයේ ශුද්ධෝත්තම පියතුමා සමග සම අයිතිවාසිකම් දරන්නෙකු ලෙස පෙරදිග සභාව සලකන්නට විය. අනෙක් අතට අපරදිග/ බටහිර සභාවේ මතය වූයේ රෝමයේ සිටින ශුද්ධෝත්තම පියතුමා මුළු සභාවේම නායකයාණන් බවයි.

මේ අතර දේව ධර්මීය ප්‍රශ්ණයක් ද මතුවිය. ඒ ශුද්ධාත්තමයාණන් ගැනයි. බටහිර සභාව පිළිගත්තේ ශුද්ධාත්මයාණන්ගෙන් පියාණන් හා පුත්‍රයාණන්ගෙන් නික්මෙන බවයි. එහෙත් පෙරදිග සභාව අදහස් කළේ ශුද්ධාත්යාණන් පියාණන්ගෙන් නික්ම පුත්‍රයාණන් මගින් පැමිණෙන බවයි. විශ්වාස ලක්ෂණය සම්බන්ධයෙන් වූ මෙම භේදය පෙරදිග හා අපරදිග සභා දේව දේව ධර්මීය අතින් දුරස්තර කිරීමට මග පැදීය. අපරදිග සභාව පාස්කු උත්සවය පාස්කු ඉරුදින පැවැත්වූ අතර පෙරදිග සභාව මහ සිකුරාදා දිනම පැවැත්වීය.

කොන්ස්තන්තීනෝපලයේ පාත්‍රියන්තුමන් වූ මයිකල් සෙලාරියස් තුමන්ගේ ප්‍රකාශයක් පෙරදිග හා අපරදිග මූළුමණින්ම වෙන්වීමට හේතු විය. දිව්‍ය පූජාව අවස්ථාවේ දී එතුමන් පැවසුයේ තමන්ට රෝමයේ ශුද්ධෝත්තම පියාණන් සමග සම අයිතියක් තිබෙන බවයි. මෙය විසඳා ගැනීමට කොන්ස්තන්තිනෝපල් කරා ගිය ශුද්ධෝත්තම පියතුමන්ගේ නියෝජිතයන් පිළිගැනීමටවත් එතුමා කැමති නොවීය. එහෙයින් ශුද්ධාසනයේ නියෝජිතයන් කළේ සෙලොරියස්තුමන් සභාවෙන් නෙරපා දමන බවට ලිපියක් ලියා දේවස්ථානයේ අල්තාරය මත තබා ආපසු පැමිණීමය. එම ලිපියට පිළිතුරු වශයෙන් සෙලාරියස්තුමන් කළේ ලිපියක් ලියා ශුද්ධෝත්තම පියතුමන් සභාවෙන් නෙරපා දමන බව පැවසීමය. මෙලෙස සභාවේ පෙරදිග අපරදිග වශයෙන් සභාවේ මහා බෙදීම ඇතිවිය.

**ii. සභාව ලෝකය තුළ දේව රාජ්‍යයේ සලකුණක් වන පිණිස ක්‍රිස්තියානි එකමුතුකමේ ඇති අවශ්‍යතාව පිළිබඳ ව පැහැදිලි කරන්න.**

ක්‍රිස්තුස් වහන්සේ මෙලොවට පැමිණියේ විශ්වයත් මනුෂය වර්ගයත් එක්සත් කිරීමටය. උන්වහන්සේ තම මරණය මගින් එය ඉටු කළ සේක. උන්වහන්සේ තම උත්තම පූජක යාච්ඤාවේ පවසන්නේ ද පියාණන් වහන්සේ සහ උන්වහන්සේ එක්සත් වන්නාසේ පියාණන් වහන්සේ විසින් තෝරා ගත් අය ද එක්සත් වීම පිණිස යාච්ඤා කරන බවයි. ශුද්ධ වූ පාවුළුතුමන් පවසන ආකාරයට දැන් ක්‍රිස්තුත් වහනසේ තුළ ඇත්තේ එකම ජනතාවකි.

එසේ වුවද අප දකින්නේ සභාවේ මුලසිටම භේද පවතින ආකාරයය. වේදභේද මගින් විටින් විට බෙදුන සභාව පෙරදිග සහ අපරදිග වශයෙන් කොටස් දෙකකට බෙදුණි.නැවත වරක් අපරදිග සභාව 16 වන ශතවර්ෂයේ මුල සිට රෝම සභාව සහ ප්‍රොතෙස්තන්ත සභා වශයෙන් බෙදා වෙන්වුණි. අද අපි දකින්නේ මෙවන් සභා රාශියක් සමග කුඩා කිතුනු සභාද දහස් ගණනින් බිහි වී ඇති ආකාරය.මෙම බෙදීම එකම ක්‍රිස්තුත් වහන්සේව ලෝකයට දීමට මහත් බාධාවකි. එය සභාව ලෝකය තුළ එක්සත්කමේ හා සමගියේ සාක්ෂියක් වනු වෙනුවට ප්‍රතිවිරුද්ධ බවේ සලකුණක් වෙයි. මේ නිසාම දේව රාජ්‍යයේ සලකුණක් වන පිණිස සභාව තුළ එක්සත්කම අත්‍යවශ්‍ය අංගයක් වෙයි. ක්‍රිස්තුත් වහන්සේ තම භාෂාව මගින් ද සාමය හා පැන කථා කල සේක. මිදිවැල සහ අතු උපමා මගින් එල දැරීම පිණිස එක්සත්කමේ අගය පහදා දෙන සේක.

**6. i. ආසන දේව මන්දිර ආශ්‍රිතව ගොඩ නැගූ පාසල් අධ්‍යාපනය යුරෝපීය සමාජයට ලබා දුන් සාධනීය දායකත්ව අගයන්න.**

තාපසාරාමවලින් ඇරඹි සභාවේ අධ්‍යාපනය හයවන ශතවර්ෂය වනවිට මීසම් දක්වා ව්‍යාප්ත විය. මෙම මීසම් පාසල් මගින් සිදු වූ සේවාව නිසා ක්‍රමයෙන් ආසන දේව මන්දිර ආශ්‍රිත පාසල් ඇරඹුණි. 09 වන සියවසයේ දී මහා චාල්ස් අධිරාජ්‍යා විසින් ආසන දේව මන්දිර ආශ්‍රිත පාසල් ආරම්භ කිරීම අනිවාර්ය කරලීය. ආසන දේව මන්දිර ආශ්‍රිතව පාසල් බිහිවීම සමග මීසම් පාසල්වල පූජකවරය පතා ඉගෙනගත් සිසුන්ට මෙම උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීමේ අවස්ථාව උදාවිය. ක්‍රමයෙන් මෙකී පාසල් යුරෝපයේ අධ්‍යාපනයේ මූලස්ථාන වූ හෙයින් ධනවත් පවුල්වල ළමුන් සහ ප්‍රභුවරුන් ද මෙම පාසල්වල ඉගෙනීමට පැමිණියහ. මුලදී පූජක සිසුන්ට අවශ්‍ය විෂයනට ආසන මන්දිර ආශ්‍රිත පාසල් සීමා වුවද ගිහියන් ද අධ්‍යාපනය ලැබූ නිසා ලෞකික විෂයන් ද අධ්‍යාපන විෂය මාලාවට ඇතුළත් කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලය වූයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගිහියන් ද ඉගැන්වීම් කටයුතුවලට සහභාගි වීම සහ

මීසම් හා අසන දේව මන්දිර ආශ්‍රිතව පමණක් නොව පොදු කණ්ඩායම් විසින්ද පාසල් ඇරඹීය. දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, වෛද්‍ය විද්‍යාව වැනි විෂයන් මෙම පොදු ආයතනවල උගන්වනු ලැබීය. මෙලෙස ආසන දේව මන්දිර ආශ්‍රිත පාසල් යුරෝපයේ වර්ධනයට බොහෝ සේ උපකාරි විය. පසුව බොහොමයක් ආසන මන්දිර ආශ්‍රීත පාසල් විශ්ව විද්‍යාල බවට පත්විය.

**ii. රටක බහු ආංශික අභිවෘද්ධිය සඳහා පාසල් අධ්‍යාපනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න.**

අධ්‍යාපනය යනු කෙනෙකු දැනුමෙන් පූර්ණවීම පමණක් නොව පූර්ණ මනුෂ්‍යයකු බිහි කිරීමයි. රටක අභිවෘද්ධිය සමාජයේ එක් අංගයක් නොව සෑම අංගයක් ගැනම සිත යොමු කළ යුත්තකි. කෙනෙකුට තම දැනුම වැඩි වර්ධනය කිරීමේ හැකියාව තිබිය හැකිය. එලෙසම දක්ෂතා ද කොතෙකුත් තිබිය හැකිය. එහෙත් ඒවා වැඩි දියුණු කර ගැනීමට ක්‍රමයක් තිබිය යුතුය. මේ නිසා අධ්‍යාපන සැකසීමේ දී පළමුවෙන්ම භාෂා දැනුම වැඩි වර්ධනය කළ යුතුය. භාෂාවක් සමග පූර්ණ මනුෂ්‍යකු බිහිවීමට ආධාර වන සාදාචාරය රටක ඉතිහාසය කලාව, ආගම සහ සංස්කෘතිය වැනි විෂයන් ගැන මූලික දැනුමක් සියල්ලන්ට ලබා දිය යුතුය. අනතුරුව සිදුවිය යුත්තේ එකිනෙකාගේ හැකියාව ලැදියාව අනුව විවිධ විෂයන් ඉගැනීමට අවස්ථාව ලබා ගැනීමට පහසුකම් සැලසීමය. රටක සෑම අංශයකම දියුණුවක් සහ වර්ධනයක් ඇතිකර ගත හැක්කේ සියල්ලන්ටම ඉගැනීමට අවස්ථාව සැලසීමෙන් හා සෑම ක්ෂේත්‍රවලටම අවශ්‍ය පුද්ගලයන් බිහිකරන අධ්‍යාපනයක් ඇති විය. රටක පාලනය සඳහා නායකයන් බිහිවීමට ද අධ්‍යාපනය අවශ්‍ය වන අතර සදාචාරය සඳහා ද අධ්‍යාපනය අවශ්‍යය අංගයකි.

**7. i. ශ්‍රී ලංකාවේ පෘතුග්‍රිසි පාලන සමයේ කතෝලික ධර්මයේ උන්නතිය උදෙසා සාහිත්‍යය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, රංග කලාව ආදිය උපයෝගී කරගත් ආකාරය සාකාච්ඡා කරන්න.**

කලාව යනු කෙනෙකුගේ අභ්‍යන්තර සිතුවිලි, හැඟීම්, පංචේන්ද්‍රයන්ගෙන් දැකිය හැකි, ඇසිය හැකි, ස්පර්ශ කළ හැකි ආදියට ඉදිරිපත් කිරීමයි. ලොව පුරාම කලාව වැඩිදියුණු වීමේ මූලිකම මාර්ගය වූයේ ආගමයි. මේ නිසාම ශ්‍රී ලංකාවට පැමිණ ධර්මදූතවරු ආගම ව්‍යාප්ත කිරීමට අධ්‍යාපනය උපයෝග කරගත්තා සේ නිතැතින්ම කලා මාධ්‍යයන් ද උපයෝගි කර ගන්නට ඇත. කෙසේවුවද පෘතුගිසි සමයට අනතුරුව කතෝලික දහම පිඩාවට ලක්කළ ලන්දේසි පාලනය නිසා පෘතුගිසි සමයේ කලාව සම්බන්ධයෙන් කථා කිරීමට ශේෂව ඇත්තේ කරුණු ස්වල්පයක් පමණය. බොහො පෘතුගිසි ධර්මදූතරු සිංහල භාෂාව හොඳින් ඉගෙන ගෙන සිංහල ව්‍යාකරණ ශබ්ද කෝෂ මෙන්ම සිංහල සාහිත්‍යයන් ද බිහිකිරීමට උත්සාහා ගත්හ. සාහිත්‍ය සඳහා සෑම විටම උපයෝගි කරගත්තේ කිතුනු තේමාවන්ය.එනම් ශුද්ධ ලියවිල්ල, ශුද්ධවන්තයන්ගේ ජීවිත කථා ආදියයි. එමෙන්ම දේවස්ථාන අසල නාට්‍ය සහ නාඩගම් පෙන්වීම සඳහා වේදිකා ගොඩනගා තිබූ බව සඳහන් වෙයි. විශේෂයෙන්ම ජේසු නිකායින් පියවරු දහම ව්‍යාප්ත කිරීම සඳහා යොදාගත් නාට්‍ය හා නාඩගම් කීපයක් නම්, ගිව්සුම හා දේව මැණියෝ, කිතු උපත, කොන්ස්ටයින්ටන් අධිරාජ්‍යයාගේ සිත් හැරීම, ආදම් හා ඒවා ආදියයි. එලෙසම ගරු අන්නා අන්තෝනියෝ පෙක්සාවෝ, දොන් ජෙරනිමෝ යන පියවරු හා අලගියවන්න මුකවැටි වැන්නන් විසින් ධර්ම ප්‍රචාරය සඳහා කවි ගීත නාට්‍ය ආදිය ලියුහ. මූර්ති හා ගෘහ නිර්මාණ ශිල්පය ආදීය ගැන කතා

කිරීමට  අද පට ඉතිරිව ඇත්තේ කොළඹ ජනාධිපති මන්දිරය අසල උද්‍යානයේ ගලක නෙලා ඇති පෘතිගිසි ලාංඡනයත් නවගමුවේ තිබි දැනට තේ වත්ත කතෝලික කෞතුකාගාරයේ තබා ඇති ශාන්ත ආනා තිරය යාපනය ප්‍රදේශයේම ඇති තවත් දේවස්ථාන කීපයක් පමණය. මේ සියලු කලා නිර්මාණයන්හි අවසාන ප්‍රතිඵලය සැබැවින්ම කිතුනු ධර්මය පතල කිරීමට ඒවා උපයෝගි කර ගැනීමයි.

**ii. වර්තමානයේ සමාජය තුළ ක්‍රිස්තියානි වටිනාකම් ප්‍රචලිත කිරීම සඳහා සාහිත්‍යය, චිත්‍ර, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව සහ සමාජ මාධ්‍යය ආදිය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.**

කලාව යනු කාලය, ප්‍රදේශය ආගම හා ජාතිය වැනි කිසිදු භේදයකින් තොරව පොදුවේ  රස විදිය හැකි හා බලපෑ හැකි විශ්ව මාධ්‍යයකි. එහෙයින් යම්කිසි  පණිවුඩයක් දිය හැකි ක්‍රමයකි.සෑම ආගමක්ම පාහේ මේ හේතුව නිසාම ලේඛන කලාවේ සිට ගෘහ නිර්මාණ කලාව දක්වා විවිධ අංශයන් ආගම පැතිරවීම හා ආගමික දැනුම ක් ලබාදීමටත්  භක්තිය ඇති කිරීමටත් යොදා ගෙන ඇත. මෙය වත්මන් තත්වය දක්වාම සත්‍යයක් වන අතර ඉදිරියේ දීත් එසේම වනු ඇත.පොත පත් මේ සඳහා ඉතාමත් ප්‍රබල ලෙස කවදාටත් යොදා ගත හැක. ආගමික පණිවුඩයක් දීම මෙන්ම මනුෂ්‍ය හා සදාචාරත්මක වටිනාකම් ප්‍රචලිත කිරීමට එවැන්නකට සුදුසු පුද්ගලයන් විසින් පොත්පත් සම්පාදනය කිරීම අවශ්‍යය.නූතන තාක්‍ෂණයට පමණක් මුල් තැන නොදී වටිනාකම් මතුවන ආකාරයට සිනමා පට, ටෙලිනාට්‍ය ආදිය නිපදවීමත් භක්තිය දනවන ගීතිකා, චිත්‍ර මූර්ති නිශ්පාදනය කළ යුතුය. මන්ද අද මේවා භේදයකින් තොරව සෑම මනුෂයෙක්ම ඉතා සමීපව තිබෙන මාධ්‍ය හෙයිනි. එසේ කළ යුතු හා කළ හැකි අය එසේ නොකළහොත් තවත් අයකු සමාජය තුළ වෛරය, ක්‍රෝධය පැතිරවීමට ඒවා යොදා ගැනීම අනිවාර්යයෙන්ම සිදු වෙයි. ගෘහ නිර්මාණ ශිල්පය ද නවීන ක්‍රම අනුව පමණක් ගොඩනැගීම වෙනුවට වඩා අධ්‍යාත්මික පරිසරයක් ගොඩනැගෙන සේ මෙන්ම යම් ආගමික හා අධ්‍යාත්මික ගුණ පණිවුඩයක් දෙන සංකේත යොදා නිර්මාණ ය කළ හැකිය.

මෙහිදී විශේෂයෙන්ම, නූතන සමාජ මාධ්‍යයන් ගැන සැලකිල්ලක් දැක්විය යුතුව ඇත. මන්දයත් නූතන තරුණ පරපුර නිතර භාවිත කරන මාධ්‍ය වී ඇත්තේ ඒවා වන හෙයිනි. කෙනෙකු ගොඩනගන හෝ විනාශ කරන අන්දමේ යම් පණිවුඩයක් දීමට කෙනෙකු අත තිබෙන ජංගම දුරකථනයට හැකියාව ඇත.

**8. i. විවාහ ජීවිතය සහ පවුල සම්බන්ධයෙන් දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ 'නූතන ලෝකයේ ශුද්ධ වූ සභාව' ප්‍රකාශයේ සඳහන් ඉගැන්වීම් මොනවාදැයි විස්තර කරන්න.**

නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව ප්‍රකාශයේ අඩංගු ප්‍රධාන තේමා හතර අතරින් එකක් වන්නේ විවාහය සහ පවුල් ජීවිතයයි. ඒවා දෙයවින් වහන්සේ විසින්ම ආරම්භයේ සිටම ඇතිකල සේ සලකන නිසා සභාව විවාහය සහ පවුල් ජීවිතය ඉතා උතුම් කොට සලකයි. සමාජය නිර්මාණය වන ප්‍රධාන සහ ප්‍රථම ඒකකය පවුල වන අතර ඉදිරියේ දී සමාජය රඳා පවතින සාධකය වන්නේ ද පවුලයි. මේ නිසාව ශුද්ධ වූ සභාව පවුල් ජීවිතය සහ විවාහය ඉතා උතුම් කොට සලකයි. අඹුසැමියන් තම ප්‍රේමය ප්‍රකාශ කරන්නත් ස්ථිරසාර ජීවිතයක් ගත කරන්නත් පවුල තුළයි. විවාහ ජීවිතයේ දී එකිනෙකා පිළිගැනීම, එකිනෙකාට ගරු කිරීම, එකිනෙකාගේ සමානත්වය පිළිගැනීම අත්‍යවශ්‍ය බව සභාව අවධාරණය කරයි. විවාහ ජීවිතයේ හා පවුලේ පරමාර්ථ ලෙස නූතන ලෝකය තුළ ශුද්ධ වූ සභාව ප්‍රකාශය දක්වන්නේ අඹුසැමියන් අතර වූ වෛවාහක ප්‍රේමය, දරුවන් බිහි කිරීම හා එම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමයි. විවාහය තුළින්

ජීවිතය බිහිකරීමට මෙන්ම ආරක්ෂා කිරීමටද අඹු සැමියන් බැඳී ඇත. අඹු සැමියෝ එකිනෙකාට විශ්වාසපක්ෂ විය යුතුය.

**ii. ක්‍රිස්තියානි පවුල් තුළ වර්ධනය වෙමින් පවතින ගැටුම් හා ව්‍යාකූලත්වය හමුවේ ප්‍රීතිමත් සහ යහපත් පවුල් ජීවිතයක් ගොඩනැගීමට දරුවන්ගේ භූමිකාව පිළිබඳව පැහැදිලි කරන්න.**

පවුල් ජීවිතයට අද විවිධාකාර බාධක හා තර්ජන එල්ල වී ඇති බව සත්‍යයකි. ඒ කිතුනු සදාචාරය මගින් පවුල් ජීවිතය පිළිබඳව කොතෙක් දැනුවත් කළ ද ක්‍රිස්තියානි පවුල් ද පොදු සමාජය තුළ පවතින ඒකකයක් වන හෙයිනි. ඉහත දී ගම් හා නගර තුළ තිබූ ඒකාග්‍රතාවය අද නැත. ඉගැනීම හා රැකියාව නිසා ගමින් හා ගෙදරින් පිටව යාමට සිදුවෙයි. ඒසේම නූතන තාක්ෂණය හා මාධ්‍ය මගින් සාදාචාරයට බලවත් පහරක් එල්ල කර ඇති අතරම මනුෂ්‍යා තනිවීමක් ද සිදු වෙයි. තවත් අතකින් පසිඳුරන් පිනවීමට නොයෙක් දේ ඇති නිසා අඹු සැමියන් අතර බැඳීම ද දෙමාපියන් හා දරුවන් අතර බැඳීම ද ක්‍රමයෙන් හීන වෙමින් පවතියි.

මෙවන් තත්වයක් යටතේ ස්ථිරසාර පවුල් ජීවිතයක් ගොඩනැගීමට දරුවන්ට කළ හැක්කේ කුමක්ද? පළමුව ඕනෑම ආගමක් මෙන්ම සදාචාර පද්ධතියක් මගින් කියාපාන අන්දමට දරුවන් දෙමාපියන්ට කීකරුවීමට ගරු කිරීමට පුරුදු විය යුතුය. මෙය දෙමාපියන්ගේ තත්වය මුදල් බලය ආදි කිසිවක් නොසලකා කළ යුත්තකි. එලෙසම දෙමාපියන් උපයන මුදල් අපතේ නොයවා ඒවා නිසිලෙස පරිහරණය කරමින් ඉගෙනීම් කටයුතු කිරීම, තමාගේ අනාගතයට සූදානම් වීම මගින් තමාගේත් දෙමාපියන්ගෙත් බලාපොරොත්තුව ඉටුකළ යුතුය. සමහර දරුවන් දෙමාපියන්ගේ ආර්ථික තත්වය ගැන නොසලකා ජංගම දුරකථන ඇඳුම් පැළඳුම් පන්තිවලට සහභාගි වීම සඳහා මුදල් නාස්ති කරන සැටි, මුදල් ලබා ගැනීමට දෙමාපියනට බල කරන සැටි දැකිය හැකිය. එලෙසම නිවස දෙමාපියන්ගේ නොව සියල්ලන්ගේ බව සලකා ගෙදරදොර වැඩ කිරීමට සියල්ලන් පුරුදු විය යුතුය. නිවාඩු දිනයන් ඒ සඳහා යොදා ගත හැකිය. සතියකට එක් දිනක් හෝ දෙමාපියන් සහෝදර සහෝදරියන් සමග පවුලක් ලෙස ගත කිරීමට යොදා ගත යුතුය. දෙමාපියන් දෙදෙනාම එක ලෙස ආදරය දක්වමින් ඔවුන් අතර ගැටුම් ඇතිවීම වළක්වා ගත යුතුය. දෙමාපියන්ට ගරු කිරීම හා ඔවුන්ව රැකබලා ගැනීම දේව පනත් මගින්ම අපට සිහිපත් කරන බව දරුවන් අමතක නොකළ යුතු ය.